

නෙත් සරසන සිත් සනහන සිරිසඟබෝ බවුන් උයන

## ⁘ සදහම් සුවය සදා සැනසිල්ලට මග ය

– කොටුගොඩ ධම්මාවාස අනුනාහිමි
මැදින් පසළොස්වක පෝද ධර්ම දේශනාව යටතේ සුචරිතයෙහි හා අප්‍රමාදයෙහි ප්‍රතිලාභ විස්තර කැරෙන ධම්මපදයෙහි සඳහන් බුද්ධ දේශනාවකට අර්ථකථනයක්.

## ⁘ මග – ඵල ලැබීම සිහිනයක් නොවේ – 16

– දෙලොස්වල උදිතධීර හිමි
නිවන් මග තහවුරු කරන බුද්ධි මට්ටම්වලට පැමිණීම බොහෝ දෙනා සිතන ආකාරයේ දුෂ්කර කටයුත්තක් නොවන බවද, දහම් මග පැහැදිලි බැවින් උනන්දුව ඇති අයට එහි ගමන් කිරීමට බාධාවක් නොමැති බවද පැහැදිලි කැරෙන ලිපි පෙළක දහසය වැනි ලිපිය.

## ⁘ සෝවාන් විය හැක්කේ භාවනාවෙන් ද?

– ඩී. අමරසිරි වීරරත්න
නිවන් මගෙහි පළමු ස්ථිර පියවර වශයෙන් දහමෙහි දැක්වෙන සෝවාන් ඵලය ලබාගැනීම සඳහා භාවනාව අවශ්‍ය නොවන බවත්, දහම් අවබෝධය තුළින් පමණක් එය ලද හැකි බවත් පැහැදිලි කිරීමට උත්සාහ දරන සංවාදශීලී ලිපියකි.

## ⁘ පිරිතෙන් වැසුණු දහමේ යථාර්ථ

– බාරාගෙදර පියතිස්ස නාහිමි
පිරිත් පොතට ඇතැම් වැදගත් සූත්‍ර දේශනා ද ඇතුළත්වීම නිසා, එම සූත්‍රවල හරය – යම් අවතක්සේරුවකට ලක්ව ඇති බවට පළ– කැරෙන සංවාදශීලී අදහසකි. පිරිත; හුදෙක් ජීවිතයට ශාන්තිය ලබා– ගැනීම සඳහා පමණක් භාවිතා කැරෙන්නක් නිසා එහි ඇතුළත් වන අර්ථ – ප්‍රායෝගිකත්වයට නැබීම විෂයෙහි ශ්‍රාවකයාගේ අවධානය අඩුවන බව ලේඛකයා පවසයි.

## ⁘ දිවා රෑ පින් වැඩෙන දෙලොවටම වැඩ වඩන පින් උල්පත්

– මොරතැන්නේ සෝමවංශ හිමි
රුක් රෝපණය, පොදු වැසිකිළි – පොදු ළිං තැනවීම, ආරාම කැණවීම, මාර්ග ඉදිකිරීම වැනි පොදු මහජනතාවට ප්‍රයෝජනවත් කටයුතු ඉටුකිරීම නිතර පින් වැඩෙන පින්කම් හැටියට බුදුරදුන් විසින් පෙන්වා වදාළ දේශනාවකට අර්ථකථනයක්.

## ⁘ Americans find guidance in Buddhism

- By Ven. Walpola Piyananda

## ⁘ උපන් ගමෙන් හැමූ සුළං

– පියතිස්ස කුමාරසිංහ
සුදෙවුන් රජුගේ ඇරයුමෙන් බුදුරදුන් කිඹුල්වත්පුර වැඩමකිරීම පිළිබඳ ශාසන ඉතිහාසගත කතාන්දරය සහ මැදින් පුර පෝද සිදුවූ අනෙකුත් සුවිශේෂ සිදුවීම් පිළිබඳ විස්තර ඇතුළත් ලිපියකි.

## ⁘ මිනිසත්බව හරවත් කරන උපාය මාර්ග

– එම්. එම්. සෙනෙවිරත්න
මිනිස් බුද්ධියේ නිසි පල ලද හැකි ධර්ම මාර්ගයෙහි ගමන් කිරීමේ වැදගත්කම, මිනිස්කමෙහි වටිනාකම පංචශීල ප්‍රතිපදාවෙන් සුර– ක්ෂිත වන ආකාරය.

## ⁘ පල දෙස විමසා කළ යුතු විලසා

– බී. ඒ. විමලසේන
බුද්ධ දේශනාවෙහි දැක්වෙන කර්ම නියාමය පිළිබඳ විග්‍රහයකි. 'කර්මය' පිළිබඳ සංකල්පය ජීවිත සාර්ථකත්වයට බලපාන අන්දම ද, දියුණුව උදෙසා තමන්ගේ ක්‍රියාකලාපය පිළිබඳ සැළකිලිමත්වීමේ වැදගත්කම ද පහද දීමට ලේඛකයා උත්සාහ කරයි.

## ⁘ බුදුරදුන් කිඹුල්වතට වැඩිදා සුදොවුන් රජු මග – ඵල ලබයි

– සිරිපාල මාදුවගේ
බුදුරදුන් තම පිය මහරජතුමන්ගේ ඇරයුමෙන් – තම උපන් ගම වූ කිඹුල්වත්පුරයට වැඩම කොට මහා ධර්මපාල ජාතකය දේශනා කිරීමේ සිද්ධිය පිළිබඳ විස්තරයකි. පන්සිල් සුරැකීමේ අනුසස් – ධර්මපාල ජාතක දේශනාවෙන් ප්‍රකට වෙයි.

## ⁘ සිදුහත් චරිතය සිදුහත් සිරිත

මථුරා, අමරාවතී, නාගර්ජුන කොණ්ඩ වැනි භාරත බෞද්ධ කලා මධ්‍යස්ථානවල දක්නට ලැබෙන සිදුහත් සිරිත ඇතුළත් කලා නිර්– මාණ පිළිබඳ විග්‍රහයක් ඇතුළත් ලිපියකි.

## ⁘ ත්‍රිපිටකය අන්තර් ජාලයෙන්

– මඩවල උපාලි හිමි
අමෙරිකන් ජාතිකයකු විසින් ත්‍රිපිටකය අන්තර් ජාලයට ඇතුළත් කර ඇති බව දැක්වෙන මෙම ලිපියේ දහම් ලැදි අයගේ ප්‍රයෝජනය සඳහා ඒ පිළිබඳ විස්තර හා අන්තර් ජාලයෙන් ඒවා ලබාගත හැකි අංක ද සඳහන් කර ඇත.